# උත්ථාන සමයේ තුන්වන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා 9 : 31 – 42

"සභාව ශුද්ධාත්ම වරමින් වැඩි වර්ධනය වූවාය."

මෙසේ මුළු ජුදයෙහි ද ගලීලයෙහි ද සමාරියෙහි ද සභාවට සාමයේ කාලයක් ඇති විය. සභාව ශක්තිසම්පන්නව, දේව ගෞරවයෙහි ද ශුද්ධාත්ම වරප්‍රසාදයෙහි ද පවතිමින් වැඩි වර්ධනය වූවාය. තවද පේදුරු සියලු පළාත්වල සැරිසරා, ලිද්දායෙහි විසූ සැදැහැවතුන් වෙතට පැමිණියේය. එහි අට අවුරුද්දක් අංශභාග රෝගයෙන් ඔත්පලව හුන් අයිනෙයස් නම් මනුෂ්‍යයෙක් ඔහුට හමු විය. පේදුරු කතා කොට, "අයිනෙයස්, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඔබට සුවය දෙන සේක. නැගිට ඔබේ යහන සකස් කර ගන්නැ" යි කීය. එකෙණෙහිම ඔහු නැගිට්ටේය. ලිද්දායෙහි ද ශාරෝනෙහි ද විසූ සියල්ලෝ ඔහු දැක ස්වාමින් වහන්සේ සරණ ගියහ.

දොර්කස් හෙවත් මුවදෙන යන අර්ථය ඇති, තබිතා නම් එක්තරා සැදැහැවත් කාන්තාවක් ජොප්පාවෙහි සිටියාය. ඈ යහපත කිරීමේ දී හෝ දන් දීමෙහි දී හෝ කිසි විටෙක වෙහෙසට පත් නොවූවාය. එහෙත් ඒ දවස්වල ඈ රෝගීව මළා ය. ඔව්හු මිනිය නාවා උඩු මහලක තැබූහ. ලිද්දා ජොප්පාවට සමීප බැවින් පේදුරු එහි සිටින බව ඇසූ ශ්‍රාවකයෝ "පමා නොවී අප වෙත එන්නැ" යි අයදිමින් මිනිසුන් දෙදෙනෙකු ඔහු වෙත යැවූහ. එවිට පේදුරු පිටත්ව ඔවුන් සමඟ ගියේය. ඔහු පැමිණි කල, ඔව්හු උඩුමහලට ඔහු කැඳවාගෙන ගියහ. සියලු වැන්දඹුවෝ ඔහු වටා සිට හඬ හඬා, දොර්කස් ජීවත්ව සිටියදී මැසූ කමිසත් කබාත් පෙන්වූහ. පේදුරු ඔවුන් සියල්ලන් බැහැර කර දණින් වැටී යාච්ඤා කර, මෘත දේහය දෙසට හැරී "තබිතා, නැගිටින්නැ" යි කීය. එවිට ඕ ඇස් ඇර, පේදුරු දැක හිඳගත්තාය. ඔහු ඈ අතින් අල්ලා සැදැහැවතුන් ද වැන්දඹුවන් ද කැඳවා පණ පිටින් සිටි ඇය ඔවුන්ට භාර දුන්නේය. ජොප්පාව පුරා මේ පුවත පතළ විය. බොහෝ දෙනෙක්

ස්වාමින් වහන්සේ අදහා ගත්හ. පේදුරු, සීමොන් නම් සම් පදම් කරන්නෙකු සමග කීප දවසක් ජොප්පාවෙහි නැවතී සිටියේය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 116 : 12-17

පිළිතුරː සමිඳුන් මා හට කළ යහපත්කම් ගැන මම එතුමන්ට කුමක් පුදම් ද?

ගීයː

සමිඳුන් මා හට කළ යහපත්කම් ගැන එතුමන්ට මම කුමක් පුදම් ද? මම ගැලවීමේ කුසලාන ගන්නෙමි. සමිඳුන්ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි.

එසේය, සමිඳුන්ගේ මුළු සෙනග ඉදිරියෙහි මාගේ බාර හාර මම ඉටු කරන්නෙමි. සැදැහැවතුන්ගේ මරණය සමිඳුන් අබියස අගනේය. සමිඳුනි, මම ඔබේ මෙහෙකරුවෙක් වෙමි.

සැබැවින්ම ඔබේ මෙහෙකරුවෙක් වෙමි. ඔබේ දාසියගේ පුත්‍රයා වෙමි. ඔබ මාගේ බැඳුම් මිදූ සේක. මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි. සමිඳුන්ගේ නාමය අමතා අයදින්නෙමි.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
“ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමග උත්ථාන කරනු ලැබූ බැවින්, දෙවියන් වහන්සේ දකුණු පස වැඩ හිඳින
ක්‍රිස්තුස් වහන්සේ වැඩ සිටින තැන ඇති, ලොව්තුරු දේ ප්‍රාර්ථනා කරන්න.”
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 6 : 60-69

**"අප කවරෙකු වෙත යමු ද? සදාතන ජීවිතයේ වචන ඔබ වෙත ඇත්තේය."**

ජීවනදායක ආහාරය ගැන ඇසූ විට, උන්වහන්සේගේ ගෝලයෝ බොහෝ දෙනෙක්, "මෙය දරා ගන්නට බැරි කීමකි. එතුමාණන්ට සවන් දී සිටිය හැක්කේ කාටදැ" යි තමන් අතරේ කතා කර ගත්හ. ගෝලයන් මෙසේ මැසිවිලි කියන බව ජේසුස් වහන්සේ දිවැසින් දැන ඔවුන් අමතා "මෙය ඔබ අධෛර්යය වීමට හේතුවක් ද? එසේ නම් මනුෂ්‍ය පුත්‍රයාණන් පෙර සිටි තැනට නගිනු බව ඔබ දුටුවොත් කෙසේද? ජීවනය දෙන්නේ ආත්මය වේ. මාංශයෙන් කිසි ප්‍රයෝජනයක් නැත. මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි. එහෙත් නොඅදහන සමහරෙක් ඔබ අතරෙහි සිටිති" යි වදාළ සේක. එසේ වදාළේ නොඅදහන්නෝ කවුරුද කියාත්, තමන් වහන්සේ පාවා දෙන්නට යන්නේ කවරෙක් ද කියාත්, ජේසුස් වහන්සේ මුල සිටම දැනගෙන සිටි බැවිනි. එහෙයින් උන්වහන්සේ ඔවුන් අමතා, "මාගේ පියාණන් වහන්සේගෙන් වරය ලැබූ කෙනෙකුට මිස අන් කිසිවෙකුට මා වෙත පැමිණිය නොහැකි බව මා කීවේ ඒ නිසාය" යි වදාළ සේක. මේ නිසා එවක් පටන් උන්වහන්සේගේ ගෝලයන්ගෙන් බොහෝ දෙනෙක් පසුබට වී තවත් උන්වහන්සේ අනුව නොගියහ.

ජේසුස් වහන්සේ දොළොස් දෙනා අමතා, "ඔබත් ඉවත්ව යන්නට සිතන්නහුදැ" යි ඇසූ සේක. සීමොන් පේදුරු පිළිතුරු දෙමින් "ස්වාමිනි, අප කවරකු වෙත යන්නද? සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබවහන්සේ වෙත ය. ඔබ දෙවියන් වහන්සේගේ ශුද්ධවරයාණන් වහන්සේ බව අපි අදහමු. එසේම ඒ බව දනිමු" යි කීය.

සුවිශේෂ වාක්‍යය එසේය.